බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් ෆාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ)විභාගය, 2025 (2026) - පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Ord,Level Examination) 2025(2026) - Practice Test

ශ්‍රේණිය தரம் Grade	11	විෂය பாடம் Subject	ගණිතය
පත්‍ර විභාගය தாள் Paper	I	කාලය காலம் Time	පැය 2 යි

නම பெயர் Name ..... විභාග අංකය கட்டிலக்கம் Index No. .....

නම / විභාග අංකය .....

නිවැරදි බවට සහතික කරමි.

.....
නිවැරදි බවට නිරීක්ෂකගේ අත්සන

වැදගත් :

(01) මෙම ප්‍රශ්න පත්‍රය පිටු අටකින් සමන්විතය.

(02) ප්‍රශ්න **සියල්ලටම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.

(03) පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.

(04) ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී **අදාළ පියවර** සහ **නිවැරදි ඒකක** දැක්වීම අවශ්‍යය.

(05) පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

A කොටසෙහි

අංක 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 02 බැගින්ද

B කොටසෙහි

එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්ද ලැබේ.

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි.

ප්‍රශ්න අංකය		ලකුණු
A	1 – 25	
B	1	
	2	
	3	
	4	
	5	
මුළු එකතුව		

.....
ලකුණු කළේ


[දෙවැනි පිටුව බලන්න...

A කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.

01. මිනිසුන් 5 දෙනෙකුට දින 3 ක් දී නිම කළ හැකි වූයේ පවරන ලද වැඩ කොටසෙන් $\frac{1}{3}$ කි. මෙම ඉතිරි වැඩ කොටස නිම කිරීමට නම් කොපමණ මිනිස් දින ප්‍රමාණයක් අවශ්‍ය වේ ද?

02. x හි අගය සොයන්න.




03. $\sqrt{16 \times 32}$ හි අගය පළමු සන්නිකර්ෂණයට.
(i) 4 x 5.2 වේ (ii) 4 x 5.4 වේ (iii) 4 x 5.7 වේ (iv) 4 x 5.8 වේ


04. විසඳන්න $x^2 - 49 = 0$

05. සුළු කරන්න. $\frac{1}{2x} - \frac{3}{4x} + \frac{11}{12x}$

06. රූපයේ දී ඇති තොරතුරු අනුව DÂC අගය සොයන්න.



07. දී ඇති කුලකවල අවයව ඇසුරෙන් $A' \cup B$ හි අවයව ලියා දක්වන්න.



08. $3(x - 1) < 2x - 3$ අසමානතාවය විසඳා x ට ගත හැකි උපරිම අගය සොයන්න.


[තුන්වැනි පිටුව බලන්න...

09. රුපියල් 80 000 ක් ලෙස තක්සේරු කර ඇති නිවසක් සඳහා කාර්තුවකට රුපියල් 1600 ක් අයකර ඇතිනම් එම නිවස පිහිටි ප්‍රාදේශිය සභාව අය කර ඇති වරිපනම් බදු ප්‍රතිශතය කීය ද?


10. (4,5) ලක්ෂ්‍යය හරහා යන අන්තඃඛණ්ඩය 2 වන සරල රේඛාවේ අනුක්‍රමණය සොයන්න.

11. A හා B ස්වායක්ත සිද්ධි දෙකක් නම් $P(A) = \frac{5}{7}$ ක් ද, $P(B) = \frac{2}{5}$ ද වේ නම් $P(A \cap B)$ සොයන්න.

12. A හි සිටින විද්වට සිරස් ලෙස පහළට ගමන් කරන පැරෂුට් එකක්, එක්තරා මෙහොතක $(X)65^0$ ක ආරෝහන කෝණයකින් පෙනේ. එතැන් සිට පැරෂුට් එක 20m ක් පහළට පැමිණි විට, එහි සිටින රිසිනිට B හි ඇති කණුවක පාමුල 70^0 ක අවරෝහන කෝණයකින් පෙනේ. මෙම තොරතුරු දී ඇති රූපයේ ලකුණු කරන්න.




13. සිලින්ඩරාකාර ටින් එකක් අලවා තිබූ ලේබලයක් මිනුම් සහිතව රූපයේ දැක්වේ. මෙය අලවා තිබූ සිලින්ඩරයේ අරය සොයන්න. (ඇලවුම් වාසි නොසලකා හරින්න)



14. ***a***, 12, -36 .... යනු ගුණෝත්තර ශ්‍රේඪියක මුල් පද 3 වේ. මෙම ශ්‍රේණියේ පොදු අනුපාතයත්, මුල් පදයත් සොයන්න.


15. දී ඇති රූපයේ තොරතුරු අනුව x හි අගය සොයන්න.



[හතරවැනි පිටුව බලන්න


CamScanner

16. ප්‍රිස්මයේ පරිමාව සොයන්න.




17. $A = \begin{pmatrix} -2 & 0 \\ 1 & 4 \end{pmatrix}$ හා $B = \begin{pmatrix} 3 \\ -1 \end{pmatrix}$ නම් AB න්‍යාසයේ ගණය ලියන්න.


18. කේන්ද්‍රය 0 වූ වෘත්තයක A, B හා C ලක්ෂ්‍ය වෘත්තය මත පිහිටා ඇත. $A\hat{B}C$ නම් හි විශාලත්වය සොයන්න.



19. දී ඇති සමුච්චිත සංඛ්‍යාත වක්‍රය ඇසුරෙන් ලකුණුවල අන්තශ්‍ඡ චතුර්ථක පරාසය සොයන්න.




20. රූපය අනුව AB = 10cm ද AC = 6cm ද නම් OP දිග සොයන්න.




[පස්වැනි පිටුව බලන්න...

21. පහත ත්‍රිකෝණ අතුරෙන් අංගසම කළ හැකි ත්‍රිකෝණ යුගලය තෝරා ලියන්න.




22. සාධක සොයන්න. $x^2 - x - 42$


23. ABCD සමාන්තරාස්‍රයේ A සිට DC ට ඇඳි ලම්බය AX වේ. $D\hat{A}X = 30^0$ නම් $B\hat{C}D$ අගය සොයන්න.



24. වෘත්තය මත A හා B ලක්ෂ පිහිටයි.
A ට හා B ට සමදුරින් ගමන් ගන්නා පථය අඳින්න.



25. ළමයෙක් පයින් ගමන් කළ ආකාරය මෙම දුර-කාල ප්‍රස්තාරයේ දැක්වේ.
ළමයගේ ගමනේ මධ්‍යක වේගය සොයන්න.



[හයවැනි පිටුව බලන්න...

B කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.

01. රිසිත් තම වැටුපෙන් 10% ක් බැංකුවේ තැන්පත් කර ඔහුට ලැබුනු ඉතිරි මුදලෙන් $\frac{1}{9}$ ක් තම සහෝදරයාගේ අධ්‍යාපන කටයුතුවලට වෙන් කරයි. ඉතිරි මුදලෙන් $\frac{5}{8}$ ක් තම දෙමාපියන්ගේ අවශ්‍යතා සඳහා වෙන් කරයි.

i. රිසිත්ට ලැබුනු මුදලින් තම සහෝදරයාගේ වියදම් සඳහා $\frac{1}{9}$ ක් වෙන් කළ පසු ඔහුට එම මුදලින් කිනම් භාගයක් ඉතිරි වේද?


ii. ඔහු තම දෙමාපියන්ගේ වියදම් සඳහා වෙන් කළේ ඔහුට ලැබුන මුදලින් කවර භාගයක් ද?

iii. සහෝදරයාගේ හා දෙමාපියන්ගේ වියදම් සඳහා මුදල් වෙන් කළ පසු ඔහුට රු. 27000 ක් තමාගේ වියදම් සඳහා ඉතිරිවේ. සහෝදරයාට හා දෙමාපියන් සඳහා වෙන්කල මුදල් ප්‍රමාණ වෙන වෙනම සොයන්න.

iV. රිසිත්ට බැංකුවේ තැන්පත් කිරීමට පෙර ලැබුණු වැටුප කොමපමණ ද?

V. ඔහු දෙමාපියන් සඳහා වියදම් කලේ තම වැටුපෙන් කවර ප්‍රතිශතයක් ද?

02. පුවරුවක ආකෘතියක් රූපයේ දැක්වේ. මෙය සෘජුකෝණාස්‍රාකාර කොටසකින්ද සෘජුකෝණී ත්‍රිකෝණාකාර කොටසකින්ද කේන්ද්‍රික ඛණ්ඩ කොටසකින්ද සමන්විත වේ. (මෙහි $\pi = {}^{22}/_{7}$ ලෙස ගන්න)



i. AHF කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය සොයන්න.

ii. CDEH සෘජුකෝණාස්‍ර කොටසේ වර්ගඵලය AHF කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය මෙන් දෙගුණයකට වඩා $7Cm^2$ ක් අඩු නම් DE දිග සොයන්න.

iii. CH = BC නම් AB දිග සොයන්න.

iV. සම්පූර්ණ ආකෘතියේ වර්ගඵලය සොයන්න.

V. BAGF දරය දිගේ B සිට F තෙක් LED බල්බ 13 ක් සවි කර තිබුනේ නම් අනුයාත බල්බ දෙකක් අතර දුර ගණනය කරන්න.

[හත්වැනි පිටුව බලන්න...

CamScanner

03. රුපියල් 100 000 ක මුදලකින් හරි අඩක් 8% ක වාර්ෂික වැල් පොලී අනුපාතයක් යටතේ බැංකුවක තැන්පත් කරයි.

i. වසර දෙකක් අවසානයේ ලැබෙන මුළු පොලිය සොයන්න.

ඉතිරි මුදල වෙළෙඳපොල මිල රුපියල් 50ක් වන අවස්ථාවක කොටස් මිල්දී ගනියි. එම කොටස් සඳහා වසර දෙකකට පසු ලැබෙන ලාභාංග ආදායම වැල් පොලියෙන් ලැබුනු පොලියට වඩා රුපියල් 3680 කින් වැඩි වේ නම්,


ii. ව්‍යාපාරයේ මිල්දී ගත් කොටස් ගනන සොයන්න.

iii. කොටසකට ගෙවන ලාභාංශය කොපමණ ද?

iV. කොටස් විකුණා ලැබුණු ප්‍රාග්ධන ලාභය රුපියල් 65 000 ක් නම් කොටසක ප්‍රාග්ධන ලාභය සොයන්න.


04. ***a***. පෙට්ටියක සර්වසම කාඩ්පත් 5ක් ඇත. එකවර දෙකක් බැගින් ඉවතට ගෙන කාඩ්පත් දෙකක් එකට තබා සංඛ්‍යාවක් සකස් කරනු ලැබේ.

i. සකස් කළ හැකි සංඛ්‍යාවල නියැදි අවකාශය කොටු දැල මත X ලකුන යොදා පෙන්වන්න.



ii. ඉවතට ගත් කාඩ්පත් දෙක මගින් සකස් කළ සංඛ්‍යාව ප්‍රථමක සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.


b. i. ඉවතට ගත් කාඩ්පත් අනුව ඔත්තේ ප්‍රථමක සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.



[අටවැනි පිටුව බලන්න...

CamScanner

ii. ඉහත තොරතුරු පහත වෙන්රූප සටහනේ දක්වන්න.



05. පැයක කාල පරාසයක දී ධාවනය වන වාහනවල වේගය දැක්වෙන වගුවක් පහත දැක්වේ.


වේගය (Kmh^{-1})	30-40	40-50	50-60	60-70	70-100
වාහන ගනන	5	6	7	5	9

i. ඉහත තොරතුරු ජාල රේඛයකින් දක්වන්න.

ii. ජාල රේඛය ඇසුරෙන් සංඛ්‍යාත බහු අස්‍රය සම්පූර්ණ කරන්න.

iii. පහත වගුව සම්පූර්ණ කර දී ඇති තලය මත සමුච්චිත සංඛ්‍යාත වක්‍රය අඳින්න. ඒ ඇසුරෙන් අන්තශ් චතුර්ථක පරාසය සොයන්න.

වේගය (Kmh^{-1})	වාහන ගනන (f)	සමුච්චිත සංඛයාතය
30-40	5	5
40-50	6	.....
50-60	.....	18
60-70	5	23
70-100	9	32



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළුම්
Department of Education - Western Province

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ)විභාගය, 2025 (2026) - පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Ord,Level Examination) 2025(2026) - Practice Test

தரம் / Grade	11	විෂය / பாடம் / Subject	ගණිතය
පත්‍රය / வினாத்தாள் / Paper	II	කාලය / காலம் / Time	පැය 3 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න තීරනණය කර ගැනීමට යොදාගන්න.

- *A* කොටසින් ප්‍රශ්න පහක් හා *B* කොටසින් ප්‍රශ්න පහක් තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී අදාල පියවර හා නිවැරදි ඒකක ලියා දක්වන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.
- පතුලේ අරය r සහ උස h වූ ඍජු වෘත්ත සිලින්ඩරයක වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය $2\Pi rh$ වේ.
- පතුලේ අරය r සහ උස h වූ ඍජු වෘත්ත සිලින්ඩරයක පරිමාව Πr^2h වේ.

A කොටස
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. $y = x(x - 2) - 2$ ආකාරයේ වර්ගජ ශ්‍රිතයක x හි අගයන් කිහිපයකට අනුරූප y හි අගයන් දක්වෙන අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

X	-2	-1	0	1	2	3	4
Y	6	1	-2	....	-2	1	6

i. $x = 1$ විට y හි අගය සොයන්න.

ii. සම්මත අක්ෂ පද්ධතිය සහ සුදුසු පරිමානයක් භාවිත කර ඉහත දී ඇති වගුවට අනුව වර්ගජ ශ්‍රිතයේ ප්‍රස්ථාරය ප්‍රස්තාර කඩදාසියේ අඳින්න.

iii. හැරුම් ලක්ෂයේ බන්ඩාංක ලියන්න.

iv. ශ්‍රිතයේ අගය සෘණව වැඩිවන x හි අගය පරාසය ලියන්න.

v. $y = (x + a)^2 - b$ ආකාරයට ඉහත ශ්‍රිතයේ ප්‍රස්ථාරයේ සමීකරනය ලියා $\sqrt{3}$ හි අගය $y = 0$ හි ධන මූලය ඇසුරෙන් ලියන්න.


02. රුපියල් 108 000 ක් වටිනා රූපවාහිනියක් මිලදී ගැනීමේදී වටිනකමෙන් $\frac{1}{3}$ ක් ගෙවා ඉතිරිය 18% ක වාර්ෂික පොලී අනපාතයක් යටතේ වාරික 24 කින් ගෙවා නිම කිරීමට ලබාගනී. මේ සඳහා පොලිය හා වාරිකය ගනනය කරනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමයට නම් ගෙවිය යුතු වාරිකයක අගය සොයන්න.

03. එක් දිනක් තුල රෝහලට ඇතුලත් වූ පිරිමි රෝගීන් ගණන කාන්තා රෝගීන් ගණනෙහි දෙගුණයට වඩා 12 ක් අඩුය. දෙවන දිනයේ, පළමු දිනයේ ඇතුලත් වූ පිරිමි රෝගීන් ගණන මෙන් දෙගුනයකින්ද කාන්තා රෝගීන් ගණන මෙන් තුන් ගුණයකින්ද ඇතුලත් විය. මේ දින දෙක තුළ ඇතුළත් වී ඇති මුළු රෝගීන් ගනන 414 නම් පළමු දින ඇතුලත් වූ පිරිමි ගණන (Y) හා කාන්තාවන් (X) ගණන සොයන්න.

[දෙවැනි පිටුව බලන්න...

CamScanner

04. අරය එකිනෙකට වෙනස් අර්ධ වෘත්තාකාර තහඩු දෙකක් පෑස්වීමෙන් මෙම තහඩුව සකස් කර ඇත.




i. විශාල අර්ධ වෘත්තයේ වර්ගඵලය π හා X ඇසුරෙන් ලියන්න.

ii. කුඩා අර්ධ වෘත්තයේ වර්ගඵලය π හා X ඇසුරෙන් ලියන්න.

iii. මුළු තහඩුවේ වර්ගඵලය 8π නම් විශාල අර්ධ වෘත්තයේ අරය ගණනය කරන්න.

05. තිරස් පොළොව මත සිටුවා ඇති AB ගසෙහි පාමුල B වන අතර ගසෙහි මුදුන A වේ. B සිට තිරස් පොළොවේ ලක්ෂ්‍යයකට සිට A ට 15m ක් දිග කම්බියක් ගැටගසා ඇත.



i. C හි නිවසක් තිබේ නම් AB මෙම ගස නිවස දෙසට ගැලවී වැටුනහොත් නිවසට හානියක් වේද? නොවේ ද? යන්න ත්‍රිකෝණමිතිය අනුපාත භාවිතයෙන් සොයන්න.

ii. ඉහත ඔබ ලබාගත් පිළිතුරු අනුව tan අනුපාතය යෙදීමෙන් C සිට ගැටගැසූ කම්බිය පොළොව සමග දරන ආනතිය 47^0 බව තහවුරු කරන්න.

06. එක්තරා වෙළඳ සලක කීරි සම්බා 5kg පැකට් විකුණූ ආකාරය පහත වගුවේ දැක්වේ.

ප.ප්‍රා (පැකට් ගනන)	5-9	10-14	15-19	20-24	25-29	30-34	35-39
සංඛ්‍යානය (දින ගනන)	4	6	8	12	10	8	1

i. ඉහත සංඛාත ව්‍යාප්තියේ මාත පන්තිය කිය ද?

ii. දිනකට විකුනා ඇති මධ්‍යන්‍ය පැකට් ගනන සොයන්න.

iii. මාස 3කට විකිණිය හැකි වෙතැයි අපේක්ෂිත පැකට් ගනන කීයක් විය හැකි ද?

iv. 1kg කින් රු. 12 ක ලාබයක් ලැබේ නම්, මාස 3 දී උපයන ලාභය රු 11 500 ට වඩා අඩු බව පෙන්වන්න.

v. පළමු දින 10 තුල විකුණා ඇත්තේ උපරිම පැකැට් ගණනක් නම් එම දින 10 තුල විකුණා ඇති පැකැට් ගනන දින 50 තුල විකුණා ඇති මුළු පැකැට් ගනනේ ප්‍රතිශතයක් ලෙස ආසන්නව වැටයු විට 11 ක් වන බව පෙන්වන්න.

[තුන්වැනි පිටුව බලන්න...

CamScanner

B කොටස
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

07. වෙනත් අවශ්‍යතා සඳහා භාවිත නොකරන ජලය පුරවා ඇති ටැංකියකින් පළමු පැයේ දී 120ml ද දෙවන පැයේ දී 116ml කින්ද තුන්වන පැයේ දී 112mlක් වශයෙන් ජලය ඒකාකාරව කාන්දු වන බව සලකන්න.

i. ජලය කාන්දුවීම සමාන්තර ශ්‍රේණියක පද ලෙස සලකා මුල් පද තුන ලියන්න.

ii. 12 වන පැය අවසානයේ හානිවන ජල පරිමාව කොපමණ ද?

iii. ජල කාන්දුව ශූන්‍ය වන්නේ පැය කීයක් ගතවූ පසුද?

iv. ටැංකියෙහි කාන්දු වූ මුළු ජල පරිමාව සොයන්න.

08. පහත දී ඇති ජ්‍යාමිතික නිර්මානය සඳහා cm/mm පරිමානය සහිත සරල දාරයක් සහ කවකටුවක් පමණක් භාවිත කරන්න. නිර්මාන රේඛා පැහැදිලිව ඇඳිය යුතුය.

i. AB = 7cm ද $C\hat{A}B = 60^0$ ද AC = 5cm ද වන පරිදි ABC ත්‍රිකෝනය නිර්මානය කරන්න.


ii. AB ට සමාන්තර රේඛාවක් C හරහා නිර්මානය කරන්න.

iii. ABC ත්‍රිකෝණයේ වර්ගඵලයට සමාන වන සේද AD = 8cm වන සේද ABC ත්‍රිකෝනයට වර්ගඵලයෙන් සමාන ත්‍රිකෝණයක් නිර්මානය කරන්න.

iv. B, C හා D ලක්ෂය හරහා යන වෘත්තය නිර්මානය කර එහි අරය මැන ලියන්න.

09.i. වෘත්තයක චාපයකින් කේන්ද්‍රය මත ආපතනය කරන කෝණය එම චාපයේ ඉතිරි කොටස මත ආපතනය කරන කෝණය මෙන් දෙගුණයක් වේ. යන ප්‍රමේයය ඇසුරෙන් එකම බන්ධය කෝණ සමාන වන බව පෙන්වන්න.

ii. රූපයේ දී ඇති තොරතුරු අනුව,



a) $A\hat{D}C$ ට සමාන කෝනයක් සම් කරන්න.

b) $AED\Delta \equiv CBE\Delta$ බව සාධනය කරන්න.

c) BC = BE නම් $3B\hat{C}D = A\hat{P}C$ බව සාධනය කරන්න.


10. අරය r වන සෘජු වෘත්ත සිලින්ඩරාකාර බඳුනක උස එහි පතුලේ අරය මෙන් $\frac{3}{4}$ කි. සෘජු වෘත්ත කේතු හැඩයේ වීදුරුවක අරය a වන අතර එහි උස සිලින්ඩරාකාර බඳුනේ අරය මෙන් $\frac{1}{2}$ කි. කේතු ආකාර වීදුරු 6 කින් සිලින්ඩරාකාර බඳුන ජලයෙන් පිරවීමට හැකි නම් $a = \sqrt{3}\frac{r}{2}$ බව පෙන්වා r = 3.5cm වන විට a හි අගය 3 cm ට වඩා වැඩි බව පෙන්වන්න.

[හතරවැනි පිටුව බලන්න...

CamScanner

11. ABC ත්‍රිකෝණයේ AB = AC වේ. AC = CD වන විට BC පාදය D තෙක් දික් කර ඇත. AD රේඛාව ABC ත්‍රිකෝණයේ පරිවෘත්තය E හි දී කපයි නම් $A\hat{B}C$ සමච්ඡේදකය BE වන බව පෙන්වන්න.

12. ග්‍රාමසේවක වසමකින් ජලය, විදුලිය, දුරකථන පහසුකම් ඇති/නැති පිළිබඳව විමසීමෙන් ලබාගත් තොරතුරු අනුව මෙම වෙන්රූප සටහන ඇඳ ඇත.
මෙම කුලකය $[B \cup C] \subset A$ ලෙස ගත් විට,



A = {ජලය ඇති}
B = {විදුලිය ඇති}
C = {දුරකථන පහසුකම් ඇති}

i. ඉහත වෙන් රූප සටහන පිටපත් කරගෙන A,B,C කුලකය නම් කරන්න.

ii. ජලය හා විදුලිය පමණක් ඇති නිවාස දැක්වෙන ප්‍රදේශය අඳුරු කරන්න.

iii. ජලය හා විදුලිය ඇති නිවාස 27 ක් ඇති අතර, ජලය, විදුලිය හා දුරකථන යන සියල්ලටම ඇති නිවාස ගනන 15 කි. මෙම තොරතුරු වෙන් රූප සටහනේ ඇතුලත් කරන්න.

iv. ජලය ඇති නිවාස 75 ක් ද, විදුලිය හා දුරකථන පහසුකම් නොමැති එහෙත් ජලය ඇති නිවාස ගනන 30 ක් ඇත්නම් දුරකථන පහසුකම් හා ජල පහසුකම් ඇති නිවාස කීයක් ත්බේ ද?

v ජලය ද නොමැති නිවාස 15ක් ඇතිනම් එම පහසුකම් පමණක් ඇති නිවාස ගනනේ ප්‍රතිශතය 34% නොඉක්මවන බව පෙන්වන්න.

CamScanner